ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2024.08.06

පැමිණිලි පාර්ශවය : එච්.වී නාලක දිසාන්ත නානායක්කාර මයා,
අංක 06, කෙලින් වීදිය,
හිඟුරාන, අම්පාර.

වගඋත්තරකාර පාර්ශවය : 01. ප්‍ර.පො.ප - ඩී.එම්.එන් මනෝජ් දිසානායක මයා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
දමන.

02. උ.පො.ප - උපුල් ජයශාන්ත මයා,
ස්ථානාධිපති,
අපරාධ විමර්ශන අංශය,
පොලිස් ස්ථානය,
දමන.

<u>පැමිණිලි අංකය : HRC/AM/98/22</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් 2022.08.01 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2022 මැයි 09 වන දින දිවයින පුරා ඇති වූ කලබලකාරී සිදුවීම්වලට තමා සම්බන්ධ බවට ව්‍යාජ චෝදනා ඉදිරිපත් කරමින් තමාව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ බවයි.

2022 මැයි 09 වන දින රාත්‍රියේ තම වෙළඳසැලෙන් හා නිවසින් තමා පිටතට නොගිය බවත්, රට තුළ පවතින අර්බුදකාරී තත්වයන්ට හා අවනීතියට විරුද්ධ වී සාමකාමීව පවත්වන ලද ක්‍රියාවන්ට තමා සහයෝගය දක්වන නමුත් කලහකාරී කටයුතු සඳහා කිසිදු සම්බන්ධයක් නොමැති බවටත් සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail } sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

2022 මැයි මස 24 වන දින තමාට දමන පොලිස් ස්ථානය වෙත පැමිණ මැයි 09 වන දින ඇති වූ කලහකාරී සිදුවීම සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා දෙන ලෙස දමන පොලීසිය දන්වා සිටි අවස්ථාවේ තමා විශ්මයට මෙන්ම දැඩි තැති ගැන්මකට ලක්වූ බවද දක්වා ඇත.

ඒ අනුව තමා දමන පොලිස් ස්ථානය වෙත ගොස් ප්‍රකාශ ලබා දෙමින් සිටියදී දමන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ නිවසට පහරදීමට සම්බන්ධ බවට සාක්ෂි ඇතැයි පවසා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ බවත්, පසුව අධිකරණයෙන් ඇප ලබාගත් බවත් දක්වා ඇත.

මෙහිදී පැමිණිලිකරු වැඩිදුරටත් දක්වා සිටින්නේ, තමා හට දේශපාලන විරුද්ධවාදීන් නොමැති වුවද දමන ප්‍රාදේශීය සභාවේ සභාපති මංගල මහින්ද ගුණවර්ධන මහතා සමඟ දේශපාලන විරසකයක් පවතින බවත්, එම අය විසින් තමා හට විවිධ බලපෑම් හා හිරිහැර සිදු කරන බවත්, මෙම අත්අඩංගුවට ගැනීමද ඔහුගේ බලපෑම මත සිදුවූයේද යන්න සම්බන්ධයෙන් සැක පවතින බවත්ය.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම :-**

මෙම පැමිණිල්ලට අදාළව 01 වන වගඋත්තර පාර්ශවීය දමන පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් 2022.10.07 දිනැති වාර්තාව ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, 2022.05.09 වන දින දමන ප්‍රාදේශීය සභාවේ සභාපති මංගල මහින්ද ගුණවර්ධන මහතාගේ නිවසට 300 කට අධික පිරිසක් පැමිණ ගල්මුල් වලින් පහරදී නිවසට හා දේපළවලට අලාභහානි සිදුවන අයුරින් අනර්ථය සිදුකර ඇති බවට පැමිණිල්ලක් ලද බවත්, ඒ අනුව විමර්ශනය සිදුකිරීමේදී එම පැමිණි පිරිස් ප්‍රකෝප වන අයුරින් අදහස් ප්‍රකාශ කිරීම හා නීතිවිරෝධී රැස්වීමක සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමේ වරදට අදාළව පොලිස් ස්ථානය වෙත පැමිණෙන ලෙසට සිදු කළ දැනුම්දීම මත 2022.05.24 වන දින මෙම පැමිණිලිකරු පොලීසියට පැමිණි පසුව අත්අඩංගුවට ගෙන අම්පාර ම/උ 2132/2022 යටතේ අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප ලබා දී ඇති බවත්ය.

සිදුකර්න ලද විමර්ශනවලදී මෙම පැමිණිලිකාර නාලක දිසාන්ත යන අය එම පැමිණි පිරිස් හට ප්‍රකෝප වන අයුරින් අදහස් ප්‍රකාශ කිරීම හා එම පිරිස් හට ප්‍රාදේශීය සභා සභාපති මංගල මහින්ද ගුණවර්ධන යන අයගේ නිවස පෙන්වමින් පිරිස් යොමු කිරීමට අදාළව සාක්ෂි සටහන් කර ඇති බවත් වැඩිදුරටත් විමර්ශන ඔට්ටමේ පවතින බවත් දන්වා ඇත.

02 වන වගඋත්තර පාර්ශවීය දමන පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති උ.පො.ප උපුල් ජයශාන්ත මහතා විසින් 2023.02.08 වන දින ශ්‍රී ලංකා ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබාදෙමින් දන්වා ඇත්තේ, 2022 මැයි 09 වන දින දිවයින පුරා ඇති වූ කලබලකාරී තත්වය මත දමන පොලිස් වසමේ පිහිටා ඇති දමන ප්‍රාදේශීය සභාවේ සභාපති මංගල මහින්ද ගුණවර්ධන මහතාගේ සහ අමාත්‍ය විමලවීර දිසානායක මහතාගේ නිවෙස්වලට පහරදී ගිනි තබා අලාභහානි සිදුකිරීම සම්බන්ධයෙන් ස්ථානාධිපතිතුමාගේ උපදෙස් අනුව අම්පාර කොට්ඨාශ අපරාධ විමර්ශන අංශයේ සහයෝගය ඇතිව විමර්ශන සිදුකළ බවයි. එහිදී ප්‍රදේශයේ පුද්ගලයන්ගෙන් ප්‍රකාශ

ලබාගැනීමට කටයුතු කිරීමේදී හිඟුරාන, සීනි කම්හල් පෙදෙස, MLQ 37 ලිපිනයැති ඔබඩ ආරච්චිගේ කල්හාර ගයාන් යන අය විසින් 2022.05.21වන දින පැය 14.50ට සාක්ෂියක් ලබාදෙමින් අලාභහානි සිදුකර ඇති මංගල මහතාගේ නිවසට යන හන්දිය ලඟදී හිඟුරාන බාර් එකේ මානවඩුගේ මස්සිනා වන ජානක හා මෙම පැමිණිලිකාර නාලක දිසාන්ත යන දෙදෙනා අමිල යන අය සිටි ස්ථානයට යතුරු පැදි වලින් පැමිණ 'හරිද බං ගැහුවද, ගැහුවද' කියා ඇසූ බවත්, එවිට අමිල යන අය 'හරි හරි' කියූ පසුව බයිසිකලය නවත්වා බැස ගල් දෙකකුත් අරගෙන මංගල මහින්ද ගුණවර්ධන මහතාගේ නිවස දෙසට ගිය බවත්, නැවත ඇවිත් ජානකයි නාලකයි, ටිෂාන්තයි 'යමු යමු දැන් වීරසිංහගේ ගෙදරට යමු' කියා යතුරුපැදිවලින් ගිය බවට දක්වා ඇති අතර, ඒ අනුව අයුතු ජන රාශියක සාමාජිකයෙකු වීමේ වරද අනාවරණය වීම මත පැමිනිලි පාර්ශවීය හවුපේ විදානාලාගේ නාලක දිසාන්ත යන අය වෙත පොලීසිය විසින් සිදු කළ දැනුම්දීම පරිදි දමන පොලිස් ස්ථානයට පැමිණ සිටියදී 2022.05.24 දින පැය 8.00ට අත්අඩංගුවට ගන්නා ලද බව සඳහන් කර ඇත.

**පැමිණිල්ලේ විරෝධතා :-**

දමන පොලිස් ස්ථානාධිපතිගේ ඉහත කී 2022.10.07 දිනැති වාර්තාවට පැමිණිලි පාර්ශවය විසින් 2022.12.07 දිනැති ලිපිය මඟින් විරෝධතා ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, ඉහත වාර්තාවේ දක්වන ලද චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, එම කලහකාරී සිදුවීම්වලට තමා සම්බන්ධ නොමැති අතර, එදින රාත්‍රියේ තමා නිවසින් හෝ වෙළඳසැලෙන් පිටතට නොගිය බවත්ය. දමන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් මෙම සාපරාධී පළිගැනීම් සිදුකරන බවත්, තමා මෙම ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වූ බවට සාක්ෂි ලබා දී ඇති සාක්ෂිකරුවන් බව පවසන අයගේ සාක්ෂියට අනුව එම අයද අදාළ ස්ථානයේ රැඳී සිටින බව පැහැදිලි වන බැවින් එසේ නම් එම අයද නීතිවිරෝධී රැස්වීමක සාමාජිකයෙකු විය යුතු බවත්, ඒ අනුව එම අය අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ යුතු බවත්ය. මෙසේ පොලීසිය විසින් ව්‍යාජ සාක්ෂි නිර්මාණය කිරීමෙන් තමාට පුරවැසියෙකු ලෙස නිදහසේ ජීවත් වීමට ඇති අයිතියට බාධාකර ඇති බවත් දන්වා ඇත.

තවද මෙම සිදුවීම සම්බන්ධයෙන් අදාළ නිවසේ තිබෙන CCTV යන්ත්‍රයේ එදිනට අදාළ දත්ත පරීක්ෂා කිරීමෙන් තමා මෙම සිදුවීමට සම්බන්ධ නොමැති බවට තහවුරු වන නමුදු එය සිදු නොකර ව්‍යාජ චෝදනා ඉදිරිපත් කරමින් තමාව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත් පැමිණිල්ලෙන් වැඩිදුරටත් දක්වා ඇත.

**විමර්ශනයේදී අනාවරණය වන කරුණු :-**

2022 මැයි 09 වන දින ඇති වූ කලහකාරී සිදුවීම්වලට සම්බන්ධ බවට චෝදනා කරමින් 2022.05.24 වන දින පැය 8.00ට පැමිනිලි පාර්ශවීය නාලක දිසාන්ත මහතා අත්අඩංගුවට ගෙන එදිනම අධිකරණයට ඉදිරිපත් කර ඇති බව අනාවරණය වේ. මෙහිදී පැමිණිලිකරුට එරෙහිව ඇති චෝදනා වශයෙන් වගඋත්තරකාර පාර්ශවයේ 2022.10.07 දිනැති වාර්තාවෙන් දක්වා ඇත්තේ, පැමිණි පිරිස්

ප්‍රකෝප වන අයුරින් අදහස් ප්‍රකාශ කිරීම හා නීති විරෝධී රැස්වීමක සමාජිකයෙකු ලෙස පෙනී සිටීමයි.

එහෙත් 2022.05.24 දින පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් කිරිමේදී, පැමිණිලිකරුට එරෙහිව චෝදනා වශයෙන් දක්වා ඇත්තේ, නීතිවිරෝධී ජනරාශියක සාමාජිකයෙකු වීම, ඇඳිරිනීති නියෝග කඩකිරීම, දේපලවලට අනර්ථයක් සිදුකිරීම යන චෝදනා වන අතර, ප්‍ර.පො.ප මනෝජ් දිසානායක ස්ථානාධිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති බී 2132/22 දරණ නඩුවේ බී වාර්තාව අනුව වගඋත්තරකාර උ.පො.ප උපුල් ජයශාන්ත යන නිලධාරියා විසින් මෙම වරදවල් කියාදී පැමිණිලිකරුව අත්අඩංගුවට ගත් බවද දක්වා ඇත.

පැමිණිල්ලට අදාළව වගඋත්තරකාර උ.පො.ප උපුල් ජයශාන්ත යන නිලධාරියා මෙම කොමිෂන් සභාවට 2023.02.08 දිනැතිව ලබා දී ඇති ප්‍රකාශයේ දක්වා ඇත්තේ, පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා ලද්දේ අයුතු ජනරාශියක සාමාජිකයෙකු වීම නිසා බවත්, නිවෙස්වලට පහරදීමේ චෝදනාවලට අත්අඩංගුවට නොගත් බවත්ය.

2022.05.09 දින රට තුළ ඇති වූ කලබලකාරී තත්වය තුළ අයුතු ජනරාශියක සමාජිකයෙකුව සිටිමින් ඉඩමකට හා නිවසකට සාපරාධි ලෙස ඇතුළු වී අනර්ථය සිදුකිරිම සම්බන්ධව වගඋත්තර දමන පොලිස් ස්ථානාධිපති විසින් 2022.05.12 දින අම්පාර මහේස්ත්‍රාත්වරයා වෙත බී/2132/22 දරණ මූලික කරුණු වාර්තා කර ඇති අතර, දමන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ නිවසට එසේ ඇතුළු වී අලාභහානි කර ඇති බවත්, සැකකරුවන් ඉදිරියේදි අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන බවත් දන්වා ඇත. එකී වරද ලං.ද.නී.සංග්‍රහයේ 140, 433, 434, 410, 344 යටතේ දඩුවම් ලැබිය හැකි වරදක් බවද දක්වා ඇත.

2022.05.12 දින ඉදිරිපත් කරන ලද බී වාර්තාවේ සඳහන් කර ඇති පරිදි ද.නී.සං 140, 430, 434, 410, 344 වරදවල් සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කර ඇති අතර, දෙවන වර ඉදිරිපත් කරන ලද 2022.05.24 දිනැති හා අංක බී 2132/22 දරණ වාර්තාවෙන් ඉහත නඩුවට අදාළව සැකකරුවන් (පැමිණිලිකරු) අධිකරණයට ඉදිරිපත් කිරීමේදී, නීති විරෝධී ජනරාශියක සාමාජිකයින් වීම, ඇඳිරි නීති නියෝග කඩකිරීම, දේපළ වලට අනර්ථය සිදුකිරීම යන චෝදනා යටතේ කරුණු වාර්තා කර ඇත.

ඒ අනුව විමර්ශනයේදී අනාවරණය වූ ඉහත කරුණු අනුව, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ වරද සම්බන්ධයෙන් පරස්පර හේතු සහ කරුණු කොමිෂන් සභාව වෙතත්, ගරු අධිකරණය වෙතත් ඉදිරිපත් කර ඇති බව අනාවරණය වන අතර, ඒ අනුව අත්අඩංගුවට ගැනීම සඳහා පැහැදිලි හේතුවක් තිබී නොමැති බව පැහැදිලි වේ.

වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා ඉදිරිපත් කරන පරස්පර හේතු සාධක අතර, 'අයුතු ජනරාශියක සාමාජිකයෙකු වීම' යන චෝදනාව සඳහා පමණක් සාක්ෂි

එකතුකර ඇති අතර, ඒ සඳහා එක් පුද්ගලයෙකුගේ සාක්ෂියක් සටහන් කර ඇත. වගඋත්තර පාර්ශවීය උ.පො.ප උපුල් ජයශාන්ත විසින් 2022.05.10 දින පැය 16.20ට දමන පොලිස් ස්ථානයේ බලඅපරාධ තොරතුරු සටහන් පොතේ 146/14 යටතේ ඇතුළත් කර ඇති සටහන අනුව 2022.05.09 දින දමන ප්‍රාදේශීය සභාපතිවරයාගේ නිවස ආරක්ෂාව සඳහා සිටියදී පැය 19.45 ට පමණ යතුරු පැදි 100 ක පුද්ගලයන් 300 ක් 350 ක් පමණ පිරිසක් සභාපතිගේ නිවසටත්, වෙළඳසැලටත්, මෝටර් රථයටත් ගල්මුල් පොලුමුගුරුවලින් පහරදුන් බව දක්වා ඇති අතර, එහෙත් පැමිණිලිකරු ඊට සම්බන්ධව වූ බවට කිසිදු තොරතුරක් ඇතුළත් කර නැත. එහෙත් 2022.05.24 දින පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී අයුතු ජනරාශියක සාමාජකයෙකු වීමේ වරද කියා දී අත්අඩංගුවට ගත් බව වගඋත්තර උ.පො.ප උපුල් ජයශාන්ත මහතාගේ 2022.05.24 දින පැය 08.10ට දමන පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු පොතේ 260/72 යටතේ ඇතුළත් කර ඇති සටහන අනුව අනාවරණය වේ.

පැමිණිලිකරුට එරෙහිව ඇති පුද්ගල සාක්ෂිය 2022.05.21 දින පැය 16.00ට 251/68 යටතේ සටහන් කර ඇති අතර, සාක්ෂිකරු විසින් ඉතාමත් අවිධිමත් ප්‍රකාශයක් ලබාදී ඇත. එහිදි ඔහු විවිධ අයගේ නම් ගම් මෙන්ම අනුවර්ථ නාමද සඳහන් කර ඇති අතර, පැමිණිලිකරු තවත් පුද්ගලයෙකු සමඟ බයික් එකෙන් ආවා යනුවෙන් ප්‍රකාශ කර ඇත. එහෙත් එමඟින් පැමිණිලිකරුට එරෙහි චෝදනා සනාථ කර නොමැති අතර, වගකිවයුතු පොලිස් නිලධාරියෙකු ලෙස එකී ප්‍රකාශ ලබාගෙන නොමැති බවද අනාවරණය වේ. ද.නි.සං 138 වගන්තිය ප්‍රකාරව අයුතු ජනරාශිය වරද ඇතුළත් වන අතර 140 ප්‍රකාරව අධිකරණය විසින් ඒ සඳහා දඩුවම් පැනවිය හැකිය. පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට එය හේතුවක් වී නම් කුමන ස්ථානයක කුමන ආකාරයේ අයුතු ජනරාශියක්ද යන්න සනාථ කළ යුතුය. 2022.05.09 දින රට තුළ ඇති වූ නොසන්සුන්තාවය තුළ ලක්ෂ ගණන් ජනතාව වීදි බැස නොයෙක් අපරාධ සිද්ධීන් මෙන්ම වෙනත් සිද්ධීන්ද සිදුකරන ලද අතර ලක්ෂ ගණන් පිරිස් අතරින් යම් පිරිසක් පමණක් ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරත වූහ. ඒ අනුව පැමිණිලිකරු සඳහන් කරන පරිදි යතුරු පැදි 100 ක් පමණ පැමිණ ඔහුගේ වෙළඳසැළ අසල මාර්ගයේ විශාල පිරිසක් රැඳී සිට විවිධ ආකාරයේ සටන් පාඨ කියමින් සිටි බවත්, එහෙත් එම පිරිසට තමා එකතු නොවුනු බවත් දක්වා ඇත. ඔහුගේ ප්‍රකාශයේ දැක්වෙන්නේ ඔහුගේ වෙළඳසැලේ තිබෙන CCTV දත්ත පද්ධතිය පරික්ෂා කිරීමෙන් ඒ බව සනාථ කරගත හැකි බවයි. නමුත් අත්අඩංගුවට ගැනීමෙන් පසුව හෝ පොලීසිය ඒවා පරීක්ෂා කර නොමැති බව අනාවරණය වේ. ඒ අනුව පැමිණිලිකරුට එල්ල වී ඇති 'අයුතු ජනරාශිය' යන චෝදනාව පැමිණිලිකරු විසින් කෙදිනක කුමන ස්ථානයකදී සිදුකරන ලද කුමන ආකාරයේ අයුතු ජනරාශියක්ද යන්න කිසිදු සාක්ෂියකින් තහවුරු කරගෙන නොමැති බවද, එය පොලීසිය විසින් ඉදිරිපත් කරන හුදු ප්‍රකාශයක් පමණක් බවද අනාවරණය වේ. ද.නී.සං 433, 434, 410, 344 යන කිසිදු වරදක් ද පැමිණිලිකරු විසින් සිදුකළ බව පොලීසිය තහවුරු කර නොමැත.

2022.05.09 දින රටපුරා සිදුවූ විවිධ උද්ඝෝෂණ ආදිය විවිධ සිදුවීම් අපරාධ විවිධ ප්‍රමාණයෙන් සෑම ප්‍රදේශයකම සිදුවිය. ඒ අතර අම්පාර, දමන ඉඟිනියාගල ආදි විවිධ පොලිස්බල ප්‍රදේශවල ද විවිධ

අපරාධ ක්‍රියා සිදුවී තිබුණි. එම අපරාධවලට සම්බන්ධ පුද්ගලයන් පිළිබඳ වාර්තා කර ඔවුන්ට එරෙහි ක්‍රියාමාර්ග ගැනීම පොලීසියේ වගකීම වන අතර, එම අපරාධ වලට සම්බන්ධ නොවූ පුද්ගලයන් අත්අඩංගුවට පත්වීම බරපතල තත්වයකි. වගඋත්තරකාර උ.පො.ප උපුල් ජයශාන්ත සඳහන් කරන ආකාරයට අයුතු ජනරාශියක 300-350 ක් පමණ පිරිසක් සිටියද ඒ කිසිවෙකුත් අත්අඩංගුවට ගෙන නැති බවද අනාවරණය වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13 වන ව්‍යවස්ථාව ප්‍රකාරව නීතියෙන් නියම කර ඇති ක්‍රියාපටිපාටියෙන් තොරව කිසිවෙකුත් අත්අඩංගුවට නොගත යුතුය. ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේදී එකී මූලික අයිතිය නොසලකා හැර නීතියට පටහැනි ලෙස අත්අඩංගුවට ගෙන ඇති බව අනාවරණය වේ.

පැමිණිලිකරු සඳහන් කරන පරිදි දමන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ දේශපාලන මැදිහත්වීම මත තමන්ව අත්අඩංගුවට ගත් බවට කරන චෝදනා සනාථ නොවේ. මක්නිසාදයත් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් කොමිෂන් සභාවට වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, තමන්ගේ නිවසට හානි කිරීම සම්බන්ධයෙන් හෝ 2022.05.09 දින සිද්ධිය සම්බන්ධයෙන් පැමිණිලිකරුට එරෙහිව කිසිදු වාචික හෝ ලිඛිත පැමිණිල්ලක් කර නැති බව ඔහු විසින් දක්වා ඇත.

**විශ්ලේෂණය :-**

පැමිණිලිකාර එච්.වී. නාලක දිසාන්ත නානායක්කාර යන අය 2022.08.01 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සිය පැමිණිල්ල ඉදිරිපත් කරමින්, වගඋත්තරකාර දමන පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් නීතිවිරෝධීව තමන්ව අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකරන ලෙසත්, වගඋත්තර පාර්ශවය වෙතින් තමන්ට වන්දියක් අයකර දෙන ලෙසත් එමගින් ඉල්ලා ඇත. පැමිණිල්ලට අදාළ චෝදනා සම්බන්ධව වගඋත්තර පාර්ශවීය පොලිස් ස්ථානාධිපති විසින් දන්වා ඇත්තේ පැමිණිලිකරු නීති විරෝධී රැස්වීමක සාමාජිකයෙකු වීම මත අත්අඩංගුවට ගත් බවයි.

පැමිණිලිකරු අත්අඩංගුවට ගත් 02 වන වගඋත්තර පාර්ශවීය උ.පො.ප උපුල් ජයශාන්ත කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත්තේ, අයුතු ජනරාශියක සාමාජිකයෙකු වීම මත අත්අඩංගුවට ගත් බවයි. 01 වන වගඋත්තරකාර පොලිස් ස්ථානාධිපතිවරයා විසින් මහේස්ත්‍රාත්වරයා වෙත යැවූ බී වාර්තාවේ දැක්වෙන්නේ නීතිවිරෝධී ජනරාශියක සාමාජිකයෙකු වීම, ඇඳිරි නීති නියෝග කඩකිරීම, දේපළ වලට අනර්ථයක් සිදුකිරීම යන චෝදනා මත අත්අඩංගුවට ගත් බවයි. එකී බී වාර්තාව අනුව ලං.ද.නී.සං 140, 433. 434, 410, 344 චෝදනා සඳහන් කර ඇත. එහෙත් කොමිෂන් සභා විමර්ශනයේදී වගඋත්තර පාර්ශවය අනාවරණය කරන්නේ අයුතු ජනරාශියක සාමාජිකයෙකු වීම නිසා අත්අඩංගුවට ගත් බවයි. ඒ අනුව නිශ්චිතව කුමන වරදක් සඳහා පැමිණිලිකරුව අත්අඩංගුවට ගත්තේද යන්න තහවුරු කර නැත.

පැමිණිලිකරුව එක් පුද්ගල සාක්ෂියක් මත අත්අඩංගුවට ගෙන ඇති අතර, එම පුද්ගල සාක්ෂිය ඉතාම අවිධිමත් විශ්වාසනීයත්වයෙන් තොර කෘතිම සාක්ෂියක් බව බැලූ බැල්මට සනාථ වේ. එම සාක්ෂිය

පමණක් පදනම් කරගෙන අයුතු ජනරාශිය යන වරදට පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර, එම වරද පොලිසිය විසින් මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ චේතනාවෙන් ගොනු කරන ලද වරදක් බව පෙනේ. ඒ අනුව පැමිණිලිකරු නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගෙන පැමිණිලිකරුට එරෙහිව අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත. එසේම අම්පාර මහේස්ත්‍රාත් අධිකරණයේ ඇති බී 2131/22 දරණ නඩුවට අදාළ මේ වනතෙක් කිසිදු චෝදනාවක් ගොනුකර නැති බව පැමිණිලි විභාගයේදී අනාවරණය වන අතර, නීතිපතිවරයා විසින් එකී කටයුතු පසෙක තබා ඇති බවද පරික්ෂණයේදී අනාවරණය වේ. ඒ හේතුවෙන්ම පැමිණිලිකරුට අධිකරණයේ පෙනී සිටීම නැවත දන්වනතුරු අවශ්‍ය නොවන බවටද ගරු අධිකරණය විසින් දැනුම්දී ඇති බව නිරීක්ෂණය වේ.

මෙම කරුණු අනුව, පැමිණිලිකරු විසින් කොමිෂන් සභාවට කරන ලද පැමිණිල්ලේ කරුණු සනාථ වන අතර, පැමිණිලිකරු අදාළ ස්ථානයේ සිටි බවට හෝ යම් ක්‍රියාවක නිරත වූ බවට කිසිදු ලෙසකින් තහවුරු වී නොමැත. නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු රාශියක් ලබා දී ඇති අතර, SCFR 313/09 දරණ <u>මිහින්තලේ රාජමහා විහාරාධිපති වලවහැංගුනවැවේ ධම්මරතන හිමි සහ මිහින්තලේ සීලරතන එදිරිව සංජීව මහානාම පොලිස්පතිවරයා මිහින්තලේ හා සෙසු අය</u> නඩුවේදී මේ සම්බන්ධයෙන් වැදගත් තීරණ ලබා දී ඇත. මෙම නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ වගඋත්තර පොලිස් නිලධාරීන් විසින් පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගෙන ඇත්තේ නීතිවිරෝධීව බවත්, <u>පැමිණිලිකරුවන්ට පාඩමක් ඉගැන්වීම සඳහා බවත් බන්ධනාගාරගත කිරීමේ චේතනාවෙන් බවත්ය.</u>

මෙම පැමිණිල්ලේදීද, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් කරුණු කිසිවක් ඉදිරිපත් වී නොමැති බවද නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

විමර්ශනයේදී අනාවරණය වන පරිදි 01, 02 යන වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් පැමිණිලිකරු නීතිවිරෝධීව අත්අඩංගුවට ගැනීම මගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී.**

01. 01 වන සහ 02 වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු වෙත රු. 10,000/- ක් බැගින් රු. 20,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. මෙම සිදුවීමේදී වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් ක්‍රියා කර ඇති ආකාරය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පවත්වා ඒ සම්බන්ධයෙන් විනය පියවර ගැනීමට පොලිස්පතිවරයා වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2024. 09 . 12 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

02. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

- අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

03. අධ්‍යක්ෂ,
පොලිස් මානව හිමිකම් කොට්ඨාශය,
අංක : 07, 7 වන මහල, කොටා ටෙරස්,
එන් .එම් පෙරේරා මාවත, කොළඹ 08.

සැ:යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.